රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2014

මගේ අංකය : EST-4/PEMNT/03/0225
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.11.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම**

රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයට තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන දැනටමත් සේවයේ යෙදී සිටින සේවකයින්ට 2014.10.24 දින සිට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට 2015 අයවැය යෝජනා අනුව රජය තීරණය කර ඇත.

02. ඒ අනුව 2014.10.24 දිනට පහත සේවා ගණයන්ට අයත් තනතුරුවල අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL 01)/(U-PL1)
(ආ) ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ ශිල්පීය (PL 02)/(U-PL2)
(ඇ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය (PL 03)/(U-PL3)
(ඈ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන බණ්ඩ 02 (MN 01)/(U-MN1)
(ඉ) කළමනාකරණ සහකාර - තාක්ෂණික බණ්ඩ 03 (MT 01)
(ඊ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන C1 (MA 1-1)
(උ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන C2 (MA 1-2)

03. ස්ථිර පත්වීම් ලබා දීම සඳහා ඉහත (අ), (ආ) සහ (ඇ) යටතේ දැක්වෙන සේවා ගණයන්ට අයත් සේවකයින් අවම වශයෙන් 8 ශ්‍රේණිය / 9 වසර සමත්ව සිටීම ප්‍රමාණවත් වේ. එසේම ඉහත (ඈ), (ඉ), (ඊ) සහ (උ) යටතේ දැක්වෙන සේවා ගණයන්ට අයත් සේවකයින් භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය ඇතුලුව අවම වශයෙන් විෂයයන් හය (06) කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව සිටිය යුතු ය.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සුදුසුකම් ලබන සියලුම සේවකයින්ට 2014.10.24 දින සිට බලපවත්වන පරිදි ඉහත සේවා ගණයන් යටතේ සේවයට බඳවා ගත් තනතුරුවලම ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට අදාල පත් කිරීම් බලධරයන් විසින් ක්‍රියා කළ යුතු ය.

05. අදාල පත්වීම් ලබා දීමෙන් අනතුරුව මේ සමඟ අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව ඒ ඒ ආයතනවල කාර්ය මණ්ඩල යාවත්කාලීන කිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නොපමාව ඒ පිළිබඳව වාර්තා කළ යුතු ය.

06. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 යටතට ගැනෙන ව්‍යාපෘති සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාල නොවේ.

07. තව ද මින් ඉදිරියට රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවකයින් බඳවා ගත හැක්කේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් හා අදාල ප්‍රතිපාදන අනුමත කර ගැනීමෙන් පසුව බැවින් සියලු ආයතන ප්‍රධානීන් එම ක්‍රමවේදයට අනුකූල විය යුතු ය.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම 2014.10.24 දිනට**

අමාත්‍යාංශය :

දෙපාර්තමේන්තුව :

| ස්ථිර කරන ලද සේවකයින්ගේ තොරතුරු | | | තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවා ගැනීම | | ස්ථිර කිරීම | |
|---|---|---|---|---|---|---|
| නම | උපන් දිනය | ජා .ප .හැ . අංකය | බඳවා ගත් දිනය | බඳවාගත් තනතුර | පත්වීම ප්‍රදානය කළ දිනය | තනතුර |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |